**ශීර්ෂය 243 - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 02 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 17 ගණන්දීමේ නිලධාරී වෙත දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සකසා ගැනීමේ දි වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වනබව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වියදම් සඳහා වූ වැය විෂයය 21 ක එකතුව රු.15,988,107,000 ක් වූ ප්‍රතිපාදනවලින් එකතුව රු.11,995,799,491 ක් වූ ප්‍රතිපාදන සියයට 28 සිට සියයට 99 දක්වා වූ පරාසයකින් ඉතිරි කර තිබුණි. | සලසාගත් ප්‍රතිපාදන උපරිමව උපයෝජනය කිරීමේ අවශ්‍යතාවය | මින් රු. මිලියන 8,455ක් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොළී සහනාධාර ගෙවීම සඳහා වෙන් වූ ප්‍රතිපාදන වලට අක්මුදල් නොලැබීම මත මෙම ඉතිරිවීම් සිදු වී ඇති බවත්, රු. මිලියන 3,541ක් අනෙකුත් සහනාධාර ගෙවීම් සඳහා වූ අතර එය පවතින ඉල්ලුම මත තීරණය වී ඇති බවත්, බැංකු සමඟ එළඹී ඇති ගිවිසුම් ප්‍රකාරව වර්ෂයේ අවසාන කාර්තුවට අදාළව බැංකුව විසින් අප වෙත ලබාදෙන සහනාධාර ඉල්ලීම් සඳහා ගෙවනු ලබන්නේ ඊළඟ වර්ෂයේ මුල් කාර්තුව තුළ දී බවත්, ඉතිරි ප්‍රතිපාදන 2019 වර්ෂයේ බැඳීම් වෙනුවෙන් වෙන්කර ඇති බවත් දන්වා එවා තිබුණි. |
| (ආ) | පුනරාවර්තන වැය විෂය 03 ක එකතුව රු. 15,000,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරි කර තිබුණි. | -එම- | මෙම වැය විෂයන්ට අදාළ ණය යෝජනා ක්‍රම මගින් ණය ලබා දී තිබුණේ වර්ෂයේ අවසාන කාර්තුවේදී බවත්, එම ඉල්ලීම් පදනම් කර සහනාධාර ගෙවනු ලබන්නේ ඊළඟ වර්ෂයේ මුල් කාර්තුව තුළ දී බවත්, ඉතිරි ප්‍රතිපාදන 2019 වර්ෂයේ බැඳීම් වෙනුවෙන් වෙන්කර ඇති බවත් දන්වා එවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූලධන වියදම් සඳහා වූ වැය විෂයය 4 ක එකතුව රු.1,727,490,000 ක් වූ ප්‍රතිපාදනවලින් එකතුව රු.977,731,556 ක් හෙවත් සියයට 57 ක ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි. | -එම- | ආසියානු සංවර්ධන බැංකුව විසින් 2019 වර්ෂයේ අරමුදල් ලබා දීමේ දී එහි මෙහෙයුම් ක්‍රියාවලියේ වෙනසක් සිදු කිරීම නිසා ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන ඉතිරි වූ බවත් අත්වැල ණය යෝජනා ක්‍රමය තුළ ද රු. මිලියන 215 ක් ආපසු ලබාදීම නිසා ද ඉතිරි ප්‍රතිපාදනය වැඩි වී ඇති බවත් දන්වා එවා තිබුණි. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා පොලී සහනාධාර වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු. 50,038,492,608 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස දක්වා නොතිබුණි. | වර්ෂය අවසානයේ පවතින බැරකම් අදාල විධිවිධාන පරිදි ගිණුම්වල හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය | ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා පොළී සහනාධාර ගෙවීමේ වැඩසටහනට 2015 වර්ෂයේ සිට ප්‍රමාණවත් පරිදි අයවැය ප්‍රතිපාදන නොලැබීම, අක්මුදල් නොලැබීම හා ප්‍රතිපාදන ආපසු පවරාගැනීම මඟින් අයවැය කළමනාකරණය කිරීම නිසා, 2019 දෙසැම්බර් 31 දින වන විට පැවති සමස්ථ පොළී සහනාධාරයේ වටිනාකම ගෙවා දැමීමට නොහැකි වී බවත් රාජ්‍ය වියදම් ගිණුම් තැබීමේ පද්ධතිය තුළ එවැනි ගිණුම්ගත කිරීමක් සටහන් කිරීමට ක්‍රමවේදයක් සලසා නොමැති බැවින් එම උපචිත වියදම අපේක්ෂිත පරිදි සටහන් කිරීමට නොහැකි වී ඇති බවත් දන්වා එවා තිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

--------------------------------

2015 අයවැය යෝජනාවක් අනුව 2017 වර්ෂයේ සිට බලපත්‍රලාභී වාණිජ බැංකු හා විශේෂ බලපත්‍රලාභී බැංකු වල රු. මිලියන 1.5 ක් හෝ ඊට අඩුවෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතු සඳහා සියයට 15 ක පොලී ප්‍රතිශතයක් ගෙවනු ලබයි. සාමාන්‍ය පොළී අනුපාතය හා ගෙවනු ලබන සියයට 15 ක පොලී අනුපාතය අතර වෙනසට අදාල මුදල් මහා භාණ්ඩාගාරය විසින් අදාල බැංකු වලට ප්‍රතිපූර්ණය කිරීම සිදුකරනු ලබයි. 2019 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය බැංකු 7 කට හා පෞද්ගලික බැංකු 22 කට අදාලව ගෙවිය යුතු මුළු පොළී සහනාධාර මුදල රු.50,038,492,608 ක් විය. 2019 වර්ෂයේ මෙම ගෙවීම් කිරීම සඳහා 2019 දෙසැම්බර් 31 දිනට පැවති ශුද්ධ ප්‍රතිපාදනය රු. 9,697,360,000 ක් වූ අතර ඉන් රු. 1,242,324,885 ක් උපයෝජනය කර තිබුණි. ඉතිරිය රු. 8,455,035,115 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ලැබී තිබුණු ප්‍රතිපාදනවලින් ඉතිරි ප්‍රතිපාදනය වන රු.8,455,035,115 ක් 2019 වර්ෂය අවසාන වන විටත් පොළී සහනාධාර ගෙවීම සඳහා උපයෝජනය කර නොතිබුණි. | වර්ධනය වෙමින් පවත්නා මෙම බැරකම කාලීනව නිරවුල් කිරීම සඳහා කඩිනම් පියවර ගැනීමේ අවශ්‍යතාවය | ගෙවිය යුතු මෙම මුදල සඳහා 2020 දෙසැම්බර් 15 දින රු.59,605,490,495 ක් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කළ අතර ඉතිරි මුදල වන රු. 2,262,927,825 ක් පියවීම 2020 දෙසැම්බර් 18 දින සිදු කරන ලදි. ඒ අනුව 2020 දෙසැම්බර් 18 දින වන විට ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතු වෙනුවෙන් වාණිජ බැංකු සඳහා 2020 දෙවන කාර්තුව (2020 ජූනි 30) වන විට ගෙවිය යුතු පොළී සහනාධාරය සම්පූර්ණයෙන්ම වාණිජ බැංකු වෙත ගෙවා නිමකර ඇති බව දන්වා එවා තිබුණි. |
| (ආ) 2016 වර්ෂයේ හා 2017 වර්ෂයේ සිට පැවත එන පිළිවෙළින් රු.6,156,498,396 ක් හා රු.13,093,646,432 ක් වූ බැරකම් සඳහා 2019 වර්ෂය අවසන් වනවිට කිසිදු මුදලක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සමස්ථ කාර්ය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 45 ක් විය. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 18 ක් පැවති අතර එයින් එක් තනතුරක් පුරප්පාඩුව පැවතුණි. | එම පුරප්පාඩු පැවතීම කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් ඒවා පිරවීමට හෝ එලෙස බලපෑමක් ඇති නොවේ නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගැනීමේ අවශ්‍යතාවය. | අදහස් දක්වා නොතිබුණි. |